# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ආර්.එස්. හෙට්ටිආරච්චි,
405/1 පන්සල පාර,
වාඳුරුප්ප
අම්බලන්තොට

**අභියාචක**

**අභියාචනා අංකය : 473/2021**

**එදිරිව**

සෞඛ්‍ය හා පෝෂණ දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
385 පූජ්‍ය බද්දේගම
විමලවංශ හිමි මාවත
කොළඹ 10
(කෑගල්ල ශික්ෂණ රෝහල)

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ රෝහල් අධ්‍යක්ෂක වෛද්‍ය මිහිරි ප්‍රියංගා මිය සහ කළමණාකාර සහකාර රෝහණ සුදශර්න හේරත් මයා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.05.26

**තීරණය කළ දිනය :** 2022.05.26

**කොමිෂන් සභාවේ තීරණය**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2020.02.10 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. ඔබේ රෝහලෙන් දළ වශයෙන් මාසිකව ඉවත් කරනු ලැබූ සායනික අපද්‍රව්‍ය ප්‍රමාණයන්, තියුණු ආසාධිත අපද්‍රව්‍ය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසිකව වෙන් වෙන් වශයෙන් තොරතුරු ලබා දෙන්න.

2. ඉහත අපද්‍රව්‍යයන් වගර් දෙක බැහැර කරන ස්ථාන මොනවාද?

3. එම අපද්‍රව්‍යය වගර් දෙක විනාශ කරන විධික්‍රම ගැන පැහැදිලි කිරීමක් ලබා දෙන්න.

4. ඉහත කායර්යන් සඳහා 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැය කරන මුදල් ප්‍රමාණයන් මාසිකව වෙන් වෙන් වශයෙන් ලබා දෙන්න.

5. අපද්‍රව්‍ය දහනය සඳහා, යම් වැඩපිළිවෙලක් හෝ "බනර්රයක්" සඳහා ඇති නව යෝජනා මොනවාද?

6. ඉහත සායනික අපද්‍රව්‍ය හා තියුණු ආසාධිත අපද්‍රව්‍ය විනාශ කිරීම සඳහා පුද්ගලික ආයතනයකට ලබා දෙන්නේ නම්, එම ආයතනය කුමක්ද? එම ආයතනයට එසේ සායනික අපද්‍රව්‍ය හා තියුණු ආසාධිත අපද්‍රව්‍ය විනාශ කිරීම සඳහා ලබාදුන් පටිපාටිය කුමක්ද? ටෙන්ඩරයක් මඟින් ලබා දී ඇත්නම් එහි පිටපතක් ද ලබා දෙන්න.

මෙම තොරතුරු ඉල්ලීමට තොරතුරු නිලධාරි විසින් 2020.07.23 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

> "...ඔබගේ අයදුම්පත ලැබුණු බවට 2020.02.15 දිනැතිව දන්වා ඇති අතර, එමඟින් අනන්‍යතාවය තහවුරු නොකර නියමයන් කඩ කිරීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමින් ලිපියක් යොමු කිරීම සම්බන්ධව කණගාටු වෙමි.
>
> ඔබගේ අයදුම්පතට අදාල තොරතුරු ලබාදීම සම්බන්ධව අනන්‍යතාවය තහවුරු කරන ලෙස නැවත දන්වමි."

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2020.08.13 වන නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. නම් කළ නිලධාරි විසින් 2020.09.24 දින පහත ප්‍රතිචාර දක්වා ඇත.

> *"...1. ඒ සම්බන්ධයෙන් කෑගල්ල හා පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂකවරුන් විසින් ඔබගේ අනන්‍යතාවය තහවුරු කරන ලෙස දන්වා ඇති බව, 2020.09.03 හා 2020.09.10 දිනැති ලිපි මඟින් මා වෙත දැනුම් දී ඇත. තවද, මෙතෙක් ඒ සම්බන්ධයෙන් පිළිතුරක් නොලද බවත්, ඔබගේ පිළිතුරු ලද පසු ඒ පිළිබඳව ඔබ වෙත පිළිතුරු සපයන බවත් මා වෙත දන්වා ඇත.*
> *2. එහෙයින්, ඔබගේ අනන්‍යතාවය තහවුරු කර අදාල පිළිතුර ලබා ගන්නා මෙන් කාරුණිකව දන්වමි."*

මෙම පිළිතුරේන්ද අතෘප්තියට පත් අභියාචක 2021.02.09 දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

**සළකා බැලීම**

දෙපාශර්වයම ඉදිරිපත් කරන ලද කරුණු කොමිෂන් සභාව විසින් පරීක්ෂාකාරීව සළකා බලන ලදී. එසේම මෙම තොරතුරු මූදා හරින ලෙසට හෝ එසේ නොමැතිව පනතේ 5 වන වගන්තිය අදාළ කරගන්නේ නම් එම ස්ථාවරය අභියාචකට දැනුම් දෙන ලෙසට අධ්‍යක්ෂක, කෑගල්ල මහරෝහල වෙත 2021.05.23 වන දින එම්.බී අත්තනායක, අතිරේක ලේකම් (පාලන), සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරමින් දැනුම් දීමක් කර ඇත.

තොරතුරු මූදා හැරීමේ ප්‍රමාදය වශයෙන් අද දින පරීක්ෂණයේදී හෙළිදරවු වූයේ, අභියාචක පූරවැසියෙක්ද යන ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අභියාචක වෙත දැනුම් දීම් කර ඇතත් ඔහු එම කරුණ සනාත කර ගැනීමට පියවර ගෙන නොමැති බවයි. තොරතුරු නිලධාරිගේ මෙම ස්ථාවරය

පදනම් කිරීමට හේතු වූ කරුණු සනාථ කරන කරුණු කිසිවක් ඉදිරිපත් කිරීමට තොරතුරු නිලධාරිට නොහැකි විය. ඉහත සඳහන් 2020.02.10 දිනැති තොරතුරු ඉල්ලීමේ 11 වන අංකය යටතේ අභියාචක පුරවැසියෙක්ය යන්න සඳහන් කර ඇති අතර එම ප්‍රකාශය අසත්‍යය යන නිගමනයට එළඹීම සඳහා කරුණු හඹා යෑමට තොරතුරු නිලධාරීට හේතු වූ කරුණු කිසිවක් ඉදිරිපත් වී නැත. එබැවින් මෙවැනි අවිනිශ්චිත හෝ මවාගත් කරුණු මත තොරතුරු නිලධාරි ක්‍රියා කිරීම කිසිසේත් අනුමත කළ නොහැකිය.

මෙම අභියාචක විසින් මේ හා සමාන තොරතුරු විමසීම ගණනාවක් ලංකාව තුළ විවිධ රෝහල් වෙත යොමු කර ඇති අතර ඒ පිළිබඳව පැන නැගුනු අභියාචනා ගණනාවක් අභියාචකගේ වාසියට තීරණය කරමින් අවසන් කර ඇත.

ඒ අනුව කොමිෂන් සභාව විසින් ගෙන ඇති එකී ස්ථාවරයන් අනුව වතර්මාන අභියාචනයට අදාළ වන ඉහත කී තොරතුරු ඉල්ලීමේ අන්තගර්ත සියලුම තොරතුරු අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය විසින් ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු. ඒ අනුව 2022.06.21 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, එකී තොරතුරු මුදා හැරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

**කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.**

**අභියාචනය අවසන් කරන ලදී.**